සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (1) | 02. (2) | 03. (4) | 04. (3) | 05. (5) | 06. (5) | 07. (1) | 08. (3) | 09. (3) | 10. (2) |
| 11. (3) | 12. (3) | 13. (4) | 14. (2) | 15. (2) | 16. (4) | 17. (1) | 18. (1) | 19. (4) | 20. (4) |
| 21.(3) | 22. (5) | 23. (4) | 24. (1) | 25. (3) | 26. (4) | 27. (4) | 28. (4) | 29. (5) | 30. (5) |
| 31.(4) | 32. (3) | 33. (2) | 34. (3) | 35. (2) | 36. (2) | 37. (3) | 38. (3) | 39. (3) | 40. (3) |
| 41.(4) | 42. (2) | 43. (4) | 44. (4) | 45. (2) | 46. (3) | 47. (3) | 48. (3) | 49. (2) | 50. (3) |

(ලකුණු 100)

## II කොටස

.01. (1) හස්ත සංඥා, ඉඟි, අංග චලන, මුහුණේ ඉරියව්

(2) බර්ලෝ සන්නිවේදන ආකෘතිය

(SMCR - ආකෘතිය)

S - සන්නිවේදකයා
නිර්මලා

M - සන්දේශය
මන්දාකිනීව බලන්න යන පණිවිඩය

C - නාලිය
දුරකථනය

R - .ග්‍රාහකයා
රෝහිණී

(3)
- ★ දෙදෙනෙක් අතර සිදුවන සන්නිවේදනයයි.
- ★ අන්තර් පුද්ගල සන්නිවේදනයේ භාෂාව මූලික වුවද අවාචික සන්නිවේදනයන් ද එකතු කර ගත හැක.
- ★ ග්‍රාහක හා සන්නිවේදක භූමිකා සජීවීව මාරුවේ.
- ★ ප්‍රතිපෝෂණය ක්ෂණික හා සාර්ථක එකක් වේ.

(4)
- ● අරමුණක් සහිතව කතා කිරීම ● පුද්ගලයා කුපිත කරවන අදහස් පැවසීමෙන් වැළකීම.
- ● අසන්නා කෙරෙහි ගෞරවයෙන් යුතුව කතා කිරීම.
- ● අර්ථවත් හා පැහැදිලි හා උචිත භාෂාවක් යොදා ගැනීම.
- ● අවස්ථාවට හා වේලාවට උචිත අයුරින් කතා කිරීම. ● ආක්‍රමණශීලී නොවීම.
- ● ප්‍රතිපෝෂණය කෙරෙහි උනන්දු වීම. කරුණු 04 ක් විස්තර කළ යුතුය.

02. (1)
- ★ මාධ්‍ය මගින් සංස්කෘතිය ගොඩ නැගීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම සිදු කෙරේ.
- ★ මාධ්‍ය හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධයේ ස්වාභාවය සංස්කෘතියේ බලවත් කම හා දුර්වල කම මත තීරණය වේ.
- ★ සංස්කෘතිය කෙරෙහි මාධ්‍යයේ බලපෑම වැඩි වන විට මාධ්‍ය සංස්කෘතිය උපදී.

(2) ● වාරණය ● නියාමනය ● පුවත් සංස්කරණය
● ජනතාව මාධ්‍ය සාක්ෂරතාවයට හුරු කිරීම.

(3)
- ● සමූහය හඳුනා ගැනීම. ● සාමූහික වැඩ වගකීම සහ වගවීම
- ● සම්මුඛ සාකච්ඡා ● විසම්මුතිය හයා එකඟතාවය
- ● ආචාරශීලීත්වය මෙයින් 04 ක් විස්තර කළ ඇත්නම් ලකුණු දෙන්න.

03. (1)
- ★ අධිපතිවාදී සන්නිවේදන සංකල්පය ★ නිදහස් ධනවාදී සන්නිවේදන සංකල්පය
- ★ සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පය ★ සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පය
- ★ සමාජ ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය ★ සංවර්ධනාත්මක සන්නිවේදන සංකල්පය

(2) සමාජ වගකීම් පිළිබඳ සංකල්පය නිදහස් මතවාදී සංකල්පයේම දිගුවකි. නිදහස් මතවාදී සංකල්පයේ නිදහස් වෙළඳපොල පදනම් කරගත් මාධ්‍ය භාවිතයක් තුළ විවිධාකාර හැලහැප්පීම් වලට භාජනය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාජයට සිදුවන බලපෑම් විෂම වන්නට විය. එහෙයින් සමාජ වගකීම් පිළිබඳ සංකල්පය බිහිවේ. හචින්ස් කොමිසම විසින් සභා වාර්තාවක් තුළින් සමාජ වගකීම් සංකල්පය පිළිබඳ කරුණු ඉදිරිපත් කළේය.

සන්නිවේදන වගකීම් සංකල්පයට අනුව ක්‍රියාත්මක වීමේදී මාධ්‍ය විසින් පවත්වා ගත යුතු ලක්ෂණ,

(1) නිදහස් අදහස් ප්‍රකාශන අයිතිය රැකදීම

(2) නිදහස් මතවාදී ක්‍රමයට අනුව ගොඩනැගෙන පුවත්පත් භාවිතයට සමාන වුවද එය ඉක්මවා ක්‍රියාත්මක වන්නකි.

(3) නිදහසට වඩා සමාජ වගකීම් ඉටු කිරීමට වැඩි අවධානය

(4) ස්වෙච්ඡාවෙන් ක්‍රියාත්මක වීම හා මාධ්‍ය කරුවා ස්වයං වාරණයෙන් යුතුව කටයුතු කිරීම.

සමාජ වගකීම් සංකල්පයට අනුව රජය නිදහස් අදහස් සඳහා විවෘත වෙළඳ පොලක් නිර්මාණය කරන අතර සමාජ වගකීම් සහිතව මාධ්‍ය මෙහෙවර ඉටු කරන ශක්තිමත් වෘත්තිය ලක්ෂණ වලින් යුතු මාධ්‍යකරුවන් සිටියි.

(3)
- මාධ්‍ය ආයතන වලට සිදු කරන පහරදීම්, සීල් තැබීම්.
- මාධ්‍යවේදීන්ට සිදු කරන පහරදීම්, ඝාතන
- මාධ්‍ය වලට සිදු කරන රාජ්‍ය මතවාදී ප්‍රහාරයන්
- මාධ්‍ය හිමිකරුවන් තම හිතවත් පිරිස් හට තනතුරු ලබා දීම
- නීතිමය ක්‍රියා මගින් මාධ්‍ය ආයතන වාරණයට හා පාලනයට ලක් කිරීම.
- මූල්‍යමය ක්‍රියා මගින් බලපෑම් එල්ල කිරීම.
- පුවත් පාලනය මගින් ඇතැම් කාලවල රජය විසින් ප්‍රවෘත්ති හැසිර වීම.

04. (1) බ්‍රිතාන්‍ය මහජන සන්නිවේදන ආයතනයේ නිර්වචනය

''මහජන සම්බන්ධතා යනු කිසියම් සංවිධානයක් සහ එයට අදාළ ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධයක් ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා සිතාමතා සැලසුම්ගතව ඉවසීමෙන් යුතුව දරණු ලබන ප්‍රයත්නයකි.''

(2)
- මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, ඡායාරූප • ප්‍රදර්ශන මාධ්‍ය සම්බන්ධතා, අනුග්‍රාහකත්වය
- පාරිසරික මෙවලම් මේවායින් 04 ක් සරලව විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.

(3) ඔබ තෝරාගත් ඕනෑම ආයතනයක මහජන සම්බන්ධතා කෙරෙහි යොදා ඇති උපක්‍රම, මෙවලම්, නිලධාරීන්ගේ ක්‍රියා කාරිත්වය ආදිය විස්තරාත්මකව උදාහරණ සහිතව ඇත්නම් ලකුණු දෙන්න.

05. (1) ⋆ පැහැදිලි නිසැකව තේරුම්ගත හැකි වනසේ කරුණු තිබීම වැකි වල වචන ප්‍රමාණය කියවා තේරුම්ගත හැකි පමණට දීර්ඝ වීම. ⋆ ව්‍යාකරණ නිවැරදි වීම, ⋆ විරාම ලක්ෂණ ආදිය පිළිබඳ ව සැලකිලිමත් වීම....

(2) • භාෂණය • රූපණය • කථනය • විවරණය • ලේඛනය

සරලව පහදන්න.

(3)
- ⋆ ශ්‍රවණය තුළින් අසන්නාගේ මනසට සන්දේශය යොමු වීම නිසා පැහැදිලිව හඬ හැසිරවිය යුතුය.
- ⋆ ඇසී නැසී යන මාධ්‍යයක් නිසා ආකර්ෂණීය ප්‍රවේග ඔස්සේ හොඳ උච්ඡාරණයක් සහිතව ග්‍රාහකයාට සම්බන්ධ වීම.
- ⋆ දීර්ඝ වැකි හා විශාල ඉලක්කම් ආදිය එකවර ඉදිරිපත් නොකිරීම.
- ⋆ සුභාවිත භාෂාවක් යොදා ගැනීම. ⋆ චිත්තරූප මැවෙන අයුරින් කතා කිරීම.

06. (1)
- තොරතුරු සම්පාදනය • විනෝදාස්වාදය • අධ්‍යාපනය ලබාදීම
- මතවාදි කාර්යය

(2)
- නූතන මාධ්‍ය යනු පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනිය නව මාධ්‍ය අන්තර්ජාලය, ජංගම දුරකථන
- නූතන මාධ්‍යයන්ගේ ක්‍රමික විකාශනයෙන් නව මාධ්‍ය බිහි වූ අතර නව මාධ්‍ය තාක්ෂණික අතින් දියුණු වෙත්ම භාවිතය ඉතා පහසුවේ. (විස්තරාත්මකව සඳහන් කළ යුතුය.)

(3) නව ලිබරල් වාදය ව්‍යාප්ත වීම.
- ⋆ ආර්ථිකමය වශයෙන් සිදු වූ නව ප්‍රවණතා (නිදහස් වෙළඳ පොළ)
- ⋆ නව මාධ්‍යයන්ගේ භාවිතය පුළුල් වීම. ⋆ බටහිර සංස්කෘතිය ව්‍යාප්ත වීම
- ⋆ තාක්ෂණික අතින් සිදු වූ වර්ධනය ⋆ අන්තර්ජාතික සබඳතා පුළුල් වීම. (විශ්ව ගම්මාන සංකල්පය)

(4)
- රටේ ප්‍රධාන මාධ්‍ය ධාරාවන්ට පිටතින් මෙම මාධ්‍ය ක්‍රියාත්මක වේ. • ලාභ ලැබීමේ අරමුණු නැත.
- ඉලක්ක ග්‍රාහක පිරිස සීමිතය • මතවාදී කාර්යයක් සිදු කරයි.
- ඉතා ප්‍රබල භූමිකාවක නියැලෙයි. / රටේ දේශපාලන ස්වභාවය මත වෙනස් වෙයි.
- ප්‍රධාන මාධ්‍ය වලින් වාරණය කෙරෙන කරුණු උද්දීපනය වේ.

07. (1) සමාජය යනු අන් කිසිවක් නොව සන්නිවේදනය හේතු කොටගෙන සන්නිවේදනය තුළින් පවත්වාගෙන යනු ලබන සබඳතා ජාලයයි. චර්යාවට අදාළ සංස්කෘතික රටාවන්ට මෙන් චර්යාවට අදාළ සෑම ක්‍රියාවක්ම ඍජුව හෝ වක්‍රව සන්නිවේදනයට සම්බන්ධකමක් ඇත. 'එඩ්වඩ් ෂාමීර්'

(2) ⋆ සන්නිවේදකයා ⋆ ග්‍රාහකයා ⋆ සාංදේශය ⋆ මාධ්‍ය ⋆ ප්‍රතිපෝෂණය ⋆ බාධක / ඝෝෂාව ⋆ ආවේගකරණය ⋆ විකේතකරණය ⋆ මූලාශ්‍රය ⋆ බලපෑම මෙයින් 4ක් සරලව විස්තර කළ යුතුය.

(3) සමාජය හා සන්නිවේදනයේ සබඳතාව හා සංස්කෘතිය පවත්වාගෙන යාමට සන්නිවේදනයේ අවශ්‍යතාවය පිළිබඳව සඳහන් කරමින් විස්තර කළ යුතුය. නිර්වචනයේ සඳහන් කරුණු තහවුරු කරමින් පිළිතුර තිබිය යුතුය.